රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/FR/Policy/Asset/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024.01.19


**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 02/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

<u>රාජ්‍ය ආයතනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සඳහා වන මාර්ගෝපදේශ</u>

මූල්‍ය නොවන වත්කම් වර්ගීකරණය, වර්ගීකරණය සඳහා කේතකරණය, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සහ සිගාස් පරිගණක පද්ධතිය තුළ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම හා සැසඳීම සම්බන්ධයෙන් 2013 වසරේ සිට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කර ඇත.

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ගිණුම් ක්‍රමය මේ වන විටත් පදනම් වී ඇත්තේ වැඩිදියුණු කරන ලද මුදල් පදනම මතය. එබැවින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ලෙස රාජ්‍ය ආයතනවල මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණය සඳහා ඓතිහාසික පිරිවැය ආකෘතිය තෝරාගෙන ඇත. පිරිවැය හඳුනාගත නොහැකි ඕනෑම වත්කමක් පළමු වරට තක්සේරු කර අදාළ පිරිවැය සිගාස් පරිගණක පද්ධතිය හරහා ගිණුම්ගත කළ යුතු ය.

ඉහත සඳහන් මාර්ගෝපදේශවලට අමතරව, නැවත තක්සේරු කෙරෙන මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණය සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය.

සිගාස් පරිගණක පද්ධතිය තුළ දැනටමත් ගිණුම්ගත කර ඇති කිසියම් මූල්‍ය නොවන වත්කමක් සඳහා නැවත තක්සේරු කිරීමක් සිදුකරන්නේ නම්, තක්සේරු කරන ලද නව වටිනාකම සිගාස් පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන නොකළ යුතු ය.

ඩබ්.ජේ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:

විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk